## හැඳින්වීම

කහ තිත් පළඟැටියා (*Aularches miliaris*) අයත් ඕතොප්ටෙරා ගෝත්‍රයට ප්‍රධාන වශයෙන් තණකොළ පෙත්තන්, පළඟැටියන් සහ පතන්ගයන් අයත් වන අතර තණකොළ පෙත්තන් සහ පළඟැටියන් හුදකලා ලෙස ද පතන්ගයන් හුදකලා හා සමූහවාසී ලෙස ද ජීවත් වේ. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් හමු වී ඇති කහ තිත් පළඟැටියා බෝගවලට හානි කරන බව පළමු වරට වාර්තා වන්නේ 1925 දී ය. ඉන් පසු වරින් වර මෙම පළඟැටියන්ගේ ගහණය අධික ලෙස ඉහළ යාම විවිධ අවස්ථාවල දී වාර්තා වී ඇත.

කහ තිත් පළඟැටියාට අමතරව ශ්‍රී ලංකාවේ විවිධ පළඟැටි වර්ග වාර්තා වී ඇත. ඔවුන් අතුරින් සාමාන්‍ය ව්‍යවහාරයේ කාන්තාර පළඟැටියන් ලෙස හඳුන්වන කාන්තාර පතන්ගයාට *(Schistocerca gregaria)* බාහිර පෙනුමින් සමානත්වයක් පෙන්වන පළඟැටියන් දැකිය හැකි වුව ද ඔවුන් කාන්තාර පතන්ගයන් ලෙස වරදවා හඳුනානොගත යුතුය.


කහ තිත් පළඟැටියා


කාන්තාර පතන්ගයාට සමානත්වයක් දක්වන ශ්‍රී ලංකාවේ දැකිය හැකි පළඟැටියෙක්


කාන්තාර පතන්ගයා

කහ තිත් පළඟැටියාගේ සුහුඹුල් ගැහැණු සතුන් පසෙහි සිදුරක් සාදා සෙ.මී. 4 - 5 පමණ ගැඹුරින් බිත්තර, කැදලි ලෙස දමන අතර එක් කැදැල්ලක බිත්තර 15 - 60ක් පමණ ඇත. බිත්තර කැදැල්ල ආරක්ෂා කිරීම සඳහා

## කහ තිත් පළඟැටියාගේ ජීවන චක්‍රය




එය වටා ඝන වූ ශ්ලේෂ්මල ආවරණයක් ද නිර්මාණය කරයි. බොහෝ විට ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල බිත්තර දැමීම සිදු කරන අතර විශාල ශාක යට සෙවන සහිත ස්ථාන මේ සඳහා තෝරා ගනියි.

කහ තිත් පළඟැටියාගේ බිත්තර කැදලිවලින් නොමේරූ සතුන් එනම් ශිෂුවන් පිටතට පැමිණෙන අතර ඔවුන් දුඹුරු පැහැතිය. දින 1 - 2කින් පසුව කළු පැහැ වන අතර, ශිෂුවන්ගේ දේහය දිගේ කහ පැහැති ඉරි දැකිය හැකිය. කහ තිත් පළඟැටියාගේ ශිෂු අවධීන් 06 ඇති අතර ශිෂු අවධිය සම්පූර්ණ කිරීම සඳහා මාස $4\,^1/_2$ - $5\,^1/_2$ ක පමණ කාලයක් ගතවෙයි.

වැඩුණු කහ තිත් පළඟැටියා ප්‍රමාණයෙන් සෙ.මී. 06 පමණ දිග වන අතර, ස්පර්ශක කළු පැහැතිය. හිස සහ උරස පෘෂ්ඨීයව කළු පැහැති වන අතර පාර්ශ්විකව කහ පැහැති ය. එම කහ පැහැති වර්ණ තීරුව පූර්ව උරස් තලයෙහි අග දක්වා විහිදෙයි. පූර්ව පියාපත් යුවළ කොළ පැහැති වන අතර, තද කහ පැහැති තිත් පූර්ව පියාපත මත පිහිටයි. මෙම තිත්වල විශාලත්වය විවිධය. ඒවායේ විෂ්කම්භය මි.මි. 2 - 3 පමණ දක්වා වෙනස් විය හැකිය. උදරය රතු සහ කළු පැහැති වලයන්ගෙන් සමන්විතය. පාදවල පැහැය කළු වන අතර, කහ පැහැති වර්ණ රටාවන් පසු පාදයේ ඉහළ කොටසෙහි දැකිය හැකිය.







## කහ තිත් පළඟැටි හානිය සහ හානියට ලක්විය හැකි බෝග

මෙම කෘමීන් පොල්, පුවක්, අඹ, හවරි නුග, කෙසෙල් වැනි ශාක ආශ්‍රිතව දැකිය හැකි වන අතර, වී වගාවට හානි කිරීමක් මේ දක්වා වාර්තා වී නොමැත. කහ තිත් පළඟැටියාගේ නොමේරූ අවධීන් එනම් ශිෂු අවස්ථාවන් සහ සුහුඹුලන් පත්‍ර ආහාරයට ගැනීමෙන් හානිය සිදු කරයි. පොල්, පුවක් වැනි ශාකවල හානිය ඉතා දරුණු ලෙස දිස් වුවද එය ශාකයෙහි අස්වැන්නට දැඩි බලපෑමක් ඇති නොකරයි. එයට හේතුව නව පත්‍ර ඇතිවීම තුළින් සිදු වූ හානිය ඌනපූර්ණය කර ගැනීමට ශාකයට ඇති හැකියාවයි.



සෑම වසරකම සුහුඹුලන් බිත්තර දමන කාලයේ දී හා ශිෂුවන් බිත්තරවලින් පිටතට එන කාලයේ දී සුපරීක්ෂාකාරීව සිටීමෙන්

**කහ තිත් පළගැටි හානිය**

අවම කර ගත හැකිය.

## කහ තිත් පළඟැටියා පාලනය

- මෙම පළඟැටියා පාලනය සඳහා සාමූහික ප්‍රයත්නයක් අවශ්‍ය වන අතර පළිබෝධයාගේ පැමිණීම පිළිබඳ අවධානයෙන් පසුවීම ඉතා වැදගත්ය. ඔක්තෝබර් හා නොවැම්බර් මාසවල විශාල ශාක යට සෙවන සහිත ස්ථානවල බිත්තර දැමීමට පැමිණෙන වැඩුණු සතුන් එකතු කර විනාශ කිරීම සිදු කළ යුතුය. මෙම අවස්ථාවේ සුහුඹුල් සතුන් එතරම් ක්‍රියාකාරී නොවන බැවින් අතින් එකතු කිරීම කළ හැකිය.

- සතුන් බිත්තර දමා ඇතැයි සැක කරන ස්ථාන හඳුනාගෙන එම ස්ථානවල පස පෙරලීමෙන් බිත්තර කැදලි හිරු එළියට නිරාවරණය කිරීම තුළින් ද එම කැදලි කුරුල්ලන් කුහුඹුවන් වැනි සතුන්ට අහාරයට ගැනීමට සැලැස්වීම තුළින් ද විනාශ කළ හැකිය.

- වැඩුණු ශිෂුවන් කුඩා ශාකවල සිටින විට, ශාක අතුවලින් තනාගත් ඉපලකින් පහර දීම තුළින් ගහණයෙන් සැළකිය යුතු ප්‍රමාණයක් විනාශ කළ හැකිය.

- ඉදලකින් අතුගා විනාශ කර දැමීම හෝ වියළි පොල් අතු යොදාගෙන ගිනි තැබීමෙන් ද විනාශ කළ හැකිය.

- බාල්දියකට ජලය ලීටර් දෙකක් පමණ දමා එයට භූමිතෙල් මිලි ලීටර් 10ක් සහ සබන් ග්‍රෑම් 10ක් පමණ දමා මිශ්‍ර කර එයට සතුන් අතින් අහුලා එකතු කිරීම සිදු කළ හැකිය.

උදය කාලයේ දී පරිසර උෂ්ණත්වය අඩු බැවින් ශිෂුවන්ගේ ක්‍රියාකාරිත්වය ද අඩුය. එබැවින් ශිෂුවන් අතින් එකතු කිරීම උදෑසන සිදු කිරීම යෝග්‍ය වේ.

- බෝග වගාවන්ට තර්ජනයක් සිදුවේ යැයි හැඟී යන්නේ නම් පමණක් පරිසරයට අවම හානියක් වන පළිබෝධනාශකයක් යෙදීම සිදු කළ හැකිය.


**සැකසුම**

සන්ධ්‍යා හේමචන්ද්‍ර

සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන)

බීජ සහතික කිරීම සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය

**විමසීම්**

පැළෑටි සංරක්ෂණ සේවය

තැ. පෙ. 22, ගන්නෝරුව, පේරාදෙණිය

දුරකථන අංකය 081 2388316

විද්‍යුත් ලිපිනය: ppsgannoruwa@yahoo.com



NAICC Designed by: NATIONAL AGRICULTURE INFORMATION & COMMUNICATION CENTER Gannoruwa Peradeniya.,


# කහ තිත් පළඟැටියා



## හඳුනාගැනීම හා පාලනය




කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය

**2020**